# ශ්‍රී ලංකාව තුල ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලෙහි (GCERF) අරමුදල් සැපයීමට විභව ප්‍රදානලාභීන් වෙතින් අභිලාෂය පළ කිරීම සඳහා කැඳවීම

අයදුම්පත් යොමුකල හැකි අවසාන දිනය : 2020 ජුලි 24 - ප.ව. 11.59 (CET)

## 1. පසුබිම

ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදල (GCERF) යනු ප්‍රචණ්ඩකාරී අන්තවාදී න්‍යාය පත්‍රයන්ට එරෙහිව ප්‍රත්‍යස්ථිතිය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව දේශීය, ප්‍රජා මට්ටමේ මුල් පියවරයන්ට සහය වීම සඳහා පළමු ගෝලීය ප්‍රයත්නය වශයෙන් පිහිටුවනු ලැබූ ස්වාධීන ස්විස් පදනමකි. ආරක්ෂාව සහ සංවර්ධනය සම්බන්ධයෙන් ක්‍රියාකාරී වන එම අරමුදල ප්‍රචණ්ඩකාරී අන්තවාදය පතුරවන දේශීය ක්‍රියාකරුවන්ට මුහුණදීම සඳහා වන ජාතික ක්‍රමෝපායන්ට සහය වීම සඳහා සාමාජික රටවල රජයන්, සිවිල් සමාජ සහ පුද්ගලික අංශ සමඟ හවුල්කාරිත්වයෙන් මෙන්ම උපදේශන මට්ටමින් ක්‍රියාකිරීමට කැපවී සිටින අතර සමාජ ඒකාබද්ධතාවය, ප්‍රජා ක්‍රියාකාරිත්වය, අවස්ථාවන්ට සමාන ප්‍රවේශය සහ පුද්ගල අරමුණ පිළිබඳ හැඟීම් ප්‍රවර්ධනය කෙරෙන ආකාරයෙන් දේශීය ප්‍රජා මට්ටමින් ප්‍රචණ්ඩකාරී අන්තවාදී ක්‍රියාකාරීන්ට එරෙහිව ගනු ලබන මූලික පියවරයන් හට සහාය වීමෙන් ප්‍රජා ප්‍රත්‍යස්ථිතිය ශක්තිමත් කිරීමට දායක වේ.

2019 වසරේදී ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලේ සාමාජික රටක් බවට පත්වූ අතර එම අරමුදලේ වැඩසටහන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ නියෝජිතයන්, වැඩසටහනට දායකත්වය සපයන පරිත්‍යාගශීලියාගේ නියෝජිතයෙකු සහ ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලේ ජාත්‍යන්තර සමාලෝචන මණ්ඩලයෙන් (IRP) සමන්විත කඩිනම් අරමුදල් මණ්ඩලයක් (AFP) පිහිටුවා ඇත. මෙම කඩිනම් අරමුදල් මණ්ඩලය විසින් බිම් මට්ටමේ සංවිධානයන්ට සුළු දීමනා ලබාදීම සහ ව්‍යාපෘතියෙන් ආරම්භ කෙරෙන දැනුම සමායෝජනය හා ව්‍යාප්ත කිරීම තුලින් ප්‍රචණ්ඩකාරී අන්තවාදයේ විශේෂ ක්‍රියාකාරීන් සම්බන්ධයෙන් කෙටි විසඳුම් ලබා දෙන ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලේ කඩිනම් අරමුදල් වැඩසටහන යටතේ අරමුදල් සැපයීම පිළිබඳ තීරණ ගැනීම හරහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලේ වැඩසටහන වෙත සහය ලබාදීම සිදු කෙරේ.

## 2. අභිලාෂය පළ කිරීම සඳහා කැඳවීම

ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදල විසින් ශ්‍රී ලංකාවේ කඩිනම් අරමුදල් මණ්ඩලය හා එක්ව එම අරමුදලේ කඩිනම් අරමුදල් වැඩසටහන කළමනාකරණය සඳහා සංවිධාන වෙත අභිලාෂය පළකිරීම සඳහා කැඳවීම සතුටින් යුතුව නිවේදනය කරනු ලැබේ.

2.1 **වැඩසටහනේ විෂය** ක්ෂේත්‍රය: තෝරාගන්නා ලද සංවිධානය (ප්‍රදානලාභියා) ශ්‍රී ලංකාවේ බිම් මට්ටමේ සංවිධාන විසින් ක්‍රියාත්මක කෙරෙන සුළු දීමනා වැඩසටහනක් දියත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතුය. වැඩසටහනේ සමස්ත වටිනාකම ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදල හා ප්‍රදානලාභියා අතර ප්‍රදාන ගිවිසුම අත්සන් කල දිනයේ සිට මාස 24 ක උපරිම කාලසීමාවක් දක්වා වන අතර ඇමෙරිකානු ඩොලර් 950,000 නොඉක්මවනු ලැබේ.

2.2 **සුළු දීමනා** : සුළු දීමනාවන්ගේ (හෝ උප ප්‍රදාන) වටිනාකම ඇමෙරිකානු ඩොලර් 5000 ත් ඇමෙරිකානු ඩොලර් 100,000 ත් අතර විය හැක. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් විසින් ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලේ මුදලින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනක් හා අරමුදල් කළමණාකරනය පිළිබඳ ඔවුන්ගේ සංවිධානමය හැකියාව පිළිබඳ තක්සේරු කිරීමෙන් අනතුරුව සුළු දීමනා සඳහා විශේෂ අරමුදල් වෙන්කිරීම මෙන්ම ප්‍රදානලාභියාගේ පරිපාලන සහ කළමනාකරණ පිරිවැය පිළිබඳ විභව ප්‍රදානලාභියා සමඟ සාකච්ඡා කරනු ලැබේ. විභව ප්‍රදානලාභියා තේරීම ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදල හා කඩිනම් අරමුදල් මණ්ඩලය මගින් සිදුකරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ කඩිනම් අරමුදල් වැඩසටහන යටතේ ලබාදෙන සහ කළමනාකරණය කරනු ලබන සුළු දීමනාවන් මගින් පහත දැක්වෙන මුල් පියවරයන් වෙත ආධාර සැපයීමට දායක වන අතරම එය එපමණකට සීමා නොවේ.

- මාර්ගගතව සහ ඉන් බැහැරව තරුණ ප්‍රජාව සමඟ සම්බන්ධ වීම තුළින් විවේචනාත්මක චින්තන කුසලතා ශක්තිමත් කිරීම සහ වෛරී භාෂණයට එරෙහිව කටයුතු කිරීම.

- බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ආගමික ආයතන සමඟ සම්බන්ධ වීම තුළින් ප්‍රජා සමගිය සහ ප්‍රචණ්ඩකාරී ත්‍රස්තවාදය වැළැක්වීම ප්‍රවර්ධනය කිරීම හරහා සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම.

- ඉවසීම, සාමකාමී සහජීවනය සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා ආරක්ෂක නියෝජිතායතන සහ ප්‍රජාවන් අතර සංවාදයන් වර්ධනය කිරීම තුළින් ප්‍රජා ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම.

- විවිධ ආගමික ප්‍රජාවන්ට අයත් අවදානම් තත්වයන්හි පසුවන තරුණ ප්‍රජාව සඳහා ආර්ථික අවස්ථාවන්ට ඇති ප්‍රවේශය වැඩි කිරීම.

- අන්තර් ආයතනික ක්‍රියාකාරකම් මගින් ප්‍රධාන සහ ආගමික අධ්‍යාපන ආයතන අතර සබඳතා ශක්තිමත් කිරීම තුළින් අධ්‍යාපන ආයතනයන්හි (උසස් පාසල සහ විශ්ව විද්‍යාල මට්ටම) තරුණ ප්‍රජාවගේ අරමුණ පිළිබඳ පුද්ගල හැඟීම් සහ විවේචනාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීම.

- තරුණ ප්‍රජාවට ඩිජිටල් සාක්ෂරතාවය ලබාදීම තුළින් අරමුණ පිළිබඳ පුද්ගල හැඟීම සහ විවේචනාත්මක චින්තන කුසලතා ප්‍රවර්ධනය කිරීම.

2.2 විවිධ ජනවාර්ගික සහ ආගමික සම්මිශ්‍රණයන්ගෙන් යුත් ප්‍රජාවන් තුල මුල් පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානලාභියා විසින් ප්‍රජාවන් මත පදනම් වූ සංවිධාන වෙත සුළු දීමනාවක් පිරිනැමීම සිදු කිරීමට නියමිත අතර කොළඹ, කලුතර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ. අනෙකුත් භූගෝලීය ස්ථාන ඇතුලත් කිරීම තුළින් ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීමේ වැඩසටහනක් මගින් ඇති කරනු ලබන බලපෑම සැලකිය යුතු ලෙස වර්ධනය කරයි නම් හා අයදුම්කරු විසින් එය අවධාරණයෙන් යුතුව සාධාරණීකරණය කරයි නම් එම ස්ථාන පිළිබඳ සලකා බලනු ලැබේ.

## 3. ප්‍රදානලාභියාගේ භූමිකාව සහ වගකීම්

වැඩසටහනේ නෛතික සහ භාරකාර වගකීම් ප්‍රදානලාභියා සතු වන අතර ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලෙහි ප්‍රතිපත්ති, පරිත්‍යාගශීලීන්ගේ අවශ්‍යතා සහ දේශීය නීතීන්ට අනුකූලව වැඩසටහන ක්‍රියාත්මක වන අතරතුර සුළු දීමනා සංවර්ධනය හා කළමනාකරණය හැසිරවිය යුතු අතර ක්‍රමවත්ව ආධාර ලබාදීම සහ පුහුණුව තුලින් බිම් මට්ටමේ සංවිධානවල ධාරිතාව ශක්තිමත් කිරීම සිදු කල යුතු වේ. ප්‍රදානලාභියා විසින් ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදල වෙත විශේෂ වාර්තාකරණ අවශ්‍යතා වලට අනුකූලව කටයුතු කිරීම අපේක්ෂිත අතර ප්‍රදානලාභියා ලියාපදිංචි වී ඇති නෛතික ආයතනය වෙත වාර්තා කිරීමේ වගකීම් අඛණ්ඩව ඉටු කල යුතුය.

## 4. තෝරාගැනීමේ නිර්ණායක

අභිලාෂය පළ කිරීමේ අරමුණ වන්නේ අයදුම්කරුට ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලේ ස්ථාපිත පූර්ව අවශ්‍යතා සපුරාලිය හැකි බව සහ සුළු දීමනා කළමනාකරණය සඳහා අවශ්‍ය හැකියාවන් වලින් සමන්විත බව ප්‍රදර්ශනය කිරීම සඳහා ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලෙන් අරමුදල් ලබා දීමට ආරාධනා කිරීමයි.

**පූර්ව අවශ්‍යතා**

අ. ශ්‍රී ලංකාවේ නියමිත නෛතික ලියාපදිංචිය.

ආ. ප්‍රදානලාභියාගේ භූමිකාව පිළිගෙන එය ඉටු කිරීම සඳහා ඇති කැමැත්ත සහ හැකියාව(ඉහත විස්තර කර ඇති පරිදි).

**හැකියාවන්**

අ. ශ්‍රී ලංකාවේ වෙනත් සංවිධාන වෙත දීමනා හෝ උප ප්‍රදාන ලබා දීම පිළිබඳ ප්‍රමාණවත් සහ මෑතකාලීන අත්දැකීම් සහ අදාල කාර්යමණ්ඩල විශේෂඥතාවන් හා පද්ධති (ප්‍රතිපත්ති, ක්‍රියාවලීන් සහ තොරතුරු පද්ධති).

ආ. ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීම, සාමය ගොඩනැංවීම, සංහිඳියාව සහ සමාජ ඒකාබද්ධතාවය මත කේන්ද්‍ර වූ වැඩසටහන් පිළිබඳ අත්දැකීම්.

ඇ. ප්‍රජා මට්ටමේ උප ප්‍රදානලාභීන්ගේ හැකියාවන් තක්සේරු කිරීම සහ වැඩි දියුණු කිරීම සම්බන්ධව ඇති අත්දැකීම් සහ හැකියාවන්.

ඈ. යෝග්‍ය වැඩසටහන්, මූල්‍ය සහ පරිපාලන භාවිතාවන් ( ව්‍යවස්ථාපිත විගණන සහ පරිත්‍යාගශීලීන් විගණනය, කීර්තිනාමය) සමඟ අනුකූල වීමට ඇති පිළිගත් හැකියාව.

ඉ. මූල්‍ය කළමනාකරණය හා ජාත්‍යන්තර පරිත්‍යාගශීලීන් අරමුදල් ලබාදීම කළමනාකරණය සහ වගකීම සම්බන්ධ අත්දැකීම් සහ හැකියාව.

**අභිලාෂය පළකිරීම ඉදිරිපත් කරන ආකාරය**

**පහත ඇමුණුම 1 බලන්න.**

සියළු අභිලාෂය පළ කිරීම් නිවැරදිව සම්පූර්ණ කර විද්‍යුත් මාර්ගයෙන් **call.srilanka@gcerf.org** වෙත 2020 ජුලි 24 දින වන විට ඉදිරිපත් කළ යුතුය. අදාල ඊමේල් පණිවුඩයේ මාතෘකාව යටතේ EOI- SRILANKA යන්න සඳහන් විය යුතුය. එසේ කිරීමට අපොහොසත් වීම ඔබගේ ඉදිරිපත් කිරීමට හානිදායක විය හැක.

නිසි පරීක්ෂණයක් සිදු කිරීම සඳහා කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

**ඇමුණුම 1 : අයදුම්පත්‍රය**

1. සංවිධානය පිළිබඳ තොරතුරු

| | | | |
|---|---|---|---|
| සංවිධානයේ සම්පූර්ණ නම | | | |
| සංවිධානයේ වර්ගය (ජාතික, ජාත්‍යන්තර) | | | |
| පිහිටුවනු ලැබූ දිනය | | | |
| පසුගිය දෙවසර තුල වාර්ෂික අයවැය | | 2018 | 2019 |
| | | | |
| පූර්ණ කාලීන සේවකයන් සංඛ්‍යාව<br>❖ සංවිධාන ව්‍යුහයේ සටහනක් දක්වන්න | | | |
| සංවිධාන මුලස්ථානයේ ලිපිනය | | | |
| ක්ෂේත්‍ර කාර්යාල සංඛ්‍යාව | | | |
| වෙබ් අඩවිය | | | |
| සමාජ මාධ්‍ය ගිණුම් | | | |
| සම්බන්ධ කරගත හැකි පුද්ගලයා | නම | | |
| | තනතුර | | |
| | ඊමේල් ලිපිනය | | |
| | දුරකථන අංකය | | |

| | |
|---|---|
| සංවිධානයේ උපායමාර්ගික ප්‍රමුඛතා | |
| ඔබගේ සංවිධානයේ නිල මෙහෙවර සඳහන් කරන්න (උපරිම වචන 100) | |
| ඔබගේ සංවිධානයට උපායමාර්ගික සැලසුමක් තිබේද ? (ඔව්/ නැත) | |
| උපායමාර්ගික සැලසුමෙන් කුමන කාලසීමාවක් ආවරණය කෙරේද ? | |
| ඔබ සංවිධානයේ වැදගත් උපායමාර්ගික ප්‍රමුඛතාවන් මොනවාද ? (උපරිම වචන 100) | |
| ඔබගේ සංවිධානය වඩාත් පිළිගැනීමට ලක්ව ඇති සුවිශේෂ විශේෂඥතාවන්ගේ ප්‍රධාන ක්ෂේත්‍ර මොනවාද ? (උපරිම වචන 200) | |

## 2. සංවිධාන හැකියාව

| | |
|---|---|
| පසුගිය වසර තුන තුළ බාහිර නියෝජිතායතනයක් මගින් ඔබගේ වැඩසටහන් කිසිවක් ඇගයීමට ලක් වී තිබේද ? (දිනය, සංවිධානය) | |

| | |
|---|---|
| සුළු දීමනා / උප ප්‍රදාන කළමනාකරණය කිරීමේ ඔබේ අත්දැකීම් විස්තර කරන්න<br>(උපරිම වචන 200) | |
| උප ප්‍රදානලාභීන් හඳුනාගැනීම සහ තෝරාගැනීමට ඔබ විසින් භාවිතා කරනු ලබන ක්‍රියාවලිය සහ නිර්ණායක විස්තර කරන්න<br>(උපරිම වචන 200) | |
| උප ප්‍රදානලාභීන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ඔබ සැලසුම් කරන්නේ කෙසේද ?<br>(උපරිම වචන 100) | |
| උප ප්‍රදානලාභීන් හඳුනාගැනීම සහ තෝරාගැනීමේදී පවතින අභිලාෂයන්ගේ විරුද්ධතා (Conflict of interest) අවදානම අඩු කරගැනීමට ඔබගේ සංවිධානය කටයුතු කරන ආකාරය විස්තර කරන්න | |
| උප ප්‍රදානලාභීන් හඳුනාගැනීම සහ තෝරාගැනීමේදී මෙන්ම සුළු දීමනා කළමනාකරණයේදී හානි නොකිරීමේ මූලධර්මය යොදා ගැනෙන ආකාරය විස්තර කරන්න | |
| උප ප්‍රදානලාභීන් වෙත ලබාදෙන අරමුදල් වල වැඩසටහන් සහ මූල්‍ය කළමනාකරණය ප්‍රදානයේ අවශ්‍යතාවන්ට අනුකූල වීම තහවුරු කිරීම සඳහා ඔබ විසින් ගනු ලබන ක්‍රියාමාර්ග විස්තර කරන්න<br><br>ප්‍රදාන කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන අවශ්‍යතාවන් හා ක්‍රියාවලීන් විස්තර කරන්න (උප ප්‍රදානලාභීන්ගේ ශක්‍යතා තක්සේරුව, අයවැය කළමනාකරණය, මුදල් ගෙවීම්, වැඩසටහන් හා මූල්‍ය වාර්තාකරණය, අධීක්ෂණය සහ ඇගයීම, උප ප්‍රදානලාභීන්ගේ චාරිකා, අභ්‍යන්තර පාලන සහ උප ප්‍රදානලාභියා විසින් වංචා/ අලාභ / අනිසි භාවිතය වැළැක්වීම සම්බන්ධයෙන් ) (උපරිම වචන 400) | |

| ඔබ සතුව ලිඛිත ප්‍රතිපත්ති හෝ මාර්ගෝපදේශ තිබේද ? (අදියරකට උපරිම වචන 100) | | |
|---|---|---|
| | ඔව්/ නැත | අදහස් (ආවරණය වන ප්‍රධාන කරුණු පිළිබඳ කෙටි විස්තරයක්) |
| අවශ්‍යතා හදුනාගැනීම හා විශ්ලේෂණය | | |
| මූලික තක්සේරුව | | |
| ආරක්ෂාව | | |
| ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම | | |
| ස්ත්‍රී පුරුෂභාවය හා විවිධත්වය | | |
| ළමා ආරක්ෂාව | | |
| තරුණ ප්‍රජාව | | |
| උප ප්‍රදානලාභීන් හදුනාගැනීම සහ තෝරා ගැනීම | | |
| උප ප්‍රදානලාභීන්ගේ ධාරිතා සංවර්ධනය | | |
| උප ප්‍රදානලාභීන්ගේ මෙහෙයුම් කළමනාකරණය | | |
| උප ප්‍රදානලාභීන්ගේ මූල්‍ය කළමනාකරණය | | |

| | |
|---|---|
| සංවිධානයට අයත් ක්ෂේත්‍ර කාර්යාල කොපමණ සංඛ්‍යාවක් රටේ පවතීද ? කුමන ස්ථාන වලද ? | |
| මූලස්ථානයේ මූල්‍ය කාර්යමණ්ඩල සංඛ්‍යාව | |
| මූලස්ථානයේ මෙහෙයුම් කළමනාකරණ කාර්ය මණ්ඩල සංඛ්‍යාව | |
| සංවිධානය තුල අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වයක් තිබේද ? එසේ නම්, අභන්තර විගණන ප්‍රධානි වාර්තා කරන්නේ කාහටද? | |
| සංවිධානය තුල ප්‍රදාන කළමනාකරණ ක්‍රියාකාරිත්වයක් තිබේද ? එසේ නම්, කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණ ද ? ඔවුන්ගේ භූමිකාව කුමක් ද ? | |

| පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ඔබ සතුව ලිඛිත ප්‍රතිපත්ති හෝ මාර්ගෝපදේශ තිබේද ? | | | | | |
|---|---|---|---|---|---|
| ගිණුම්කරණය හා මූල්‍ය වාර්තාකරණය | අයවැය හා මුදල් කළමනාකරණය | මානව සම්පත් කළමනාකරණය | භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය | වංචා, අල්ලස්, දූෂණ | අභිලාෂයන්ගේ විරුද්ධතා |
| ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ |

| ඔබේ සංවිධානයේ විශාලම පරිත්‍යාගශීලීන් තිදෙනා කවුරුන්ද ? (අත්සන් කල දායකත්වයේ සමස්ත වටිනාකම) | | | | | |
|---|---|---|---|---|---|
| 2018 (නම) | (ඇ.ඩො) | 2019 (නම) | (ඇ.ඩො) | 2020 (නම) | (ඇ.ඩො) |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**ව්‍යවස්ථාපිත විගණන (ඔබගේ පසුගිය විගණන වාර්තා දෙකේ පිටපත් මෙම පෝරමය සමඟ ඉදිරිපත් කරන්න )**

| ආවරණය වන කාලසීමාව | විගණන ආයතනයේ නම | විගණන ආයතනයට ඇති ජාත්‍යන්තර සබඳතාවන් සඳහන් කරන්න | විගණන මතය | විගණන නිර්දේශ කිසිවක් තවදුරටත් විවෘත ද ? එසේ නම්, ඔබ විසින් ඒවා පූර්ණව ක්‍රියාත්මක කරනුයේ කවදා ද ? |
|---|---|---|---|---|
| පසුගිය පිස්කල් වර්ෂය | | | | |
| පසුගිය වර්ෂයට පෙර පිස්කල් වර්ෂය | | | | |

උප ප්‍රදානලාභියෙකු හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ඔබගේ සංවිධානයේ තරඟකාරී ටෙන්ඩර් සඳහා වන ප්‍රතිපත්තිය පිළිබිඹු කල යුතුය.

3. ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීම හා ඊට එරෙහිව කටයුතු කිරීමේ (P/CVE) වැඩසටහන් පිළිබඳ අත්දැකීම්

| | |
|---|---|
| ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීමේ වැඩසටහන් (හෝ සාමය ගොඩනැංවීම, ගැටුම් නිරාකරණය හා සමාජ ඒකාබද්ධතාවය) පිළිබඳ ඔබ සංවිධානයේ අත්දැකීම් මොනවාද ? | |
| ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීමේ වැඩසටහන් සඳහා ප්‍රදානලාභියෙකු වීම සහ උප ප්‍රදානලාභීන් වෙත සුළු දීමනා ලබාදීම සඳහා ඔබගේ සංවිධානය සුදුසු වන්නේ කෙසේද ? | |
| ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැළැක්වීම සම්බන්ධයෙන් අභිලාෂය පළ කිරීම සඳහා වන කැඳවීම් කෙටුම්පත් කිරීම සහ තක්සේරු කිරීම පිළිබඳ ඔබේ අත්දැකීම් මොනවාද ? | |
| අනෙකුත් ක්‍රියාකාරිකයන් (උදා. රජය, ආගමික බලධාරීන්, සිවිල් සමාජ සංවිධාන වැනි) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබ සැලසුම් කරන්නේ කෙසේ ද ? | |
| ස්ත්‍රී පුරුෂභාවයේ භූමිකාව පිළිබඳ ඇමතීමට ඔබ සැලසුම් කරන්නේ කෙසේද ? | |
| මානව හිමිකම් සම්බන්ධ ගැටළු පිළිබඳ ඇමතීමට ඔබ සැලසුම් කරන්නේ කෙසේද ? | |
| ඔබට පුරෝකථනය කල හැකි ඉහලම අවදානම් තුන මොනවාද සහ ඒවා අවම කිරීමට ඔබ සැලසුම් කරන්නේ කෙසේද ? | |
| මෙම කැඳවුමෙන් සලකා බැලෙන භූගෝලීය ස්ථාන පිළිබඳ ඔබගේ අත්දැකීම් මොනවාද ? | |
| සුළු දීමනා වැඩසටහන සඳහා ඔබගේ සංවිධානය විසින් මෙම කැඳවුමෙන් සලකා බැලෙන කුමන භූගෝලීය ස්ථානයක් යෝජනා කරයිද ? ඔබ විසින් යෝජනා කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක් සඳහා සාධාරණීකරනය සපයන්න | |

ඔබගේ සංවිධානය ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලෙහි ප්‍රදානලාභියා ලෙස තෝරාගනු ලැබුවහොත් ඔබ විසින් අභිලාෂය පළ කිරීම සඳහා වන කැඳවුම් ආරම්භ කිරීම සහ ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදල සහ කඩිනම් අරමුදල් මණ්ඩලයෙහි අපේක්ෂාවන් සපුරාලන විභව උප ප්‍රදානලාභීන් කෙටි ලැයිස්තුගත කිරීම අපේක්ෂිතය. දීමනා ප්‍රදානය කිරීම සහ උප ප්‍රදානලාභීන් සඳහා ධාරිතා වර්ධන සැලැස්මක් නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීම ඇතුළු දීමනා කළමනාකරන කටයුතු ප්‍රදානලාභියා සතු වගකීමකි. ප්‍රදානලාභියා ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදල සමඟ අනුබද්ධිත නෛතික ආයතනය වන අතර උප ප්‍රදානලාභීන් වෙනුවෙන් නෛතික හා භාරකාර වගකීම් දරනු ලැබේ.

මෙම අභිලාෂය පළ කිරීම අත්සන් කිරීම තුළින් ඔබ විසින්

- ❖ ඔබගේ සංවිධානය විසින් ඉහත විස්තර කර ඇති පරිදි ප්‍රදානලාභියාගේ භූමිකාව පිළිගත හැකි බව
- ❖ ඔබ දන්නා තරමින් මෙහි ලබා දී ඇති තොරතුරු නිවැරදි බව
- ❖ ඔබ ගෝලීය ප්‍රජා සම්බන්ධතා සහ ප්‍රතිරෝධී අරමුදලේ ආචාරධර්ම පද්ධතියේ විස්තර කෙරෙන කොන්දේසි කියවා ඊට අනුකූල වීමට එකඟ වන බව තහවුරු කෙරේ.

අත්සන් කලේ :

..........................................................................

නම :

තනතුර :

සංවිධානය :

දිනය : 2020/........./.......